ඒකාබද්ධ සේවා චක්‍ර ලේඛ : 01/2014

මගේ අංකය: PA/CS/6/4/ කා.ක.විභාග,III
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2014.04. 04

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන්ගේ</u>**

**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය.</u>**

රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගවල ප්‍රතිඵල මත 2007.07.01,2009.02.02 සහ 2009.04.02 දිනයන්හි දී රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට බඳවා ගන්නා ලද නිලධාරීන්ට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට අදාළව සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි නොපැවැත්වීම මත එම කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා පත්වීම් දින සිට පවත්වන ලද අනුගාමී විභාග වාර 04 ක් දක්වා සහන කාලයක් පහත පරිදි ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

<table>
<tr><th>විභාග අවස්ථාව</th><th>පත්වීම් දිනය</th><th>සහනය ලබා දීමට සලකා බලනු ලබන විභාග පැවැත් වූ දිනයන්</th><th>පත්වීම් දිනය</th><th>සහනය ලබා දීමට සලකා බලනු ලබන විභාග පැවැත් වූ දිනයන්</th><th>පත්වීම් දිනය</th><th>සහනය ලබාදීමට සලකා බලනු ලබන විභාග පැවැත් වූ දිනයන්</th></tr>
<tr><td>1</td><td rowspan="4">2007.07.01</td><td>2008.08.30</td><td rowspan="4">2009.02.02</td><td>2009.07.26</td><td rowspan="4">2009.04.02</td><td>2010.07.17</td></tr>
<tr><td>2</td><td>2009.07.26</td><td>2010.07.17</td><td>2011.10.01</td></tr>
<tr><td>3</td><td>2010.07.17</td><td>2011.10.01</td><td>2013.01.27</td></tr>
<tr><td>4</td><td>2011.10.01</td><td>2013.01.27</td><td>..................</td></tr>
</table>

02. මේ අනුව උක්ත දිනයන්හි පත්වීම් ලත් නිලධාරීන් අදාළ විභාග වාර 04 ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරන්නේ නම් වැටුප් වර්ධක විලම්භනය නොවන අතර සෙසු නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරන දිනය දක්වා පරිවාස කාලය දීර්ඝ වේ.

03. ඉහත 02 ඡේදයෙහි සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව මේ වන විට වැටුප් වර්ධක විලම්භනය කරන ලද නිලධාරීන්ගේ පරිවාස කාලය සංශෝධනය කිරීම සඳහා ආයතන ප්‍රධානියා මඟින් ඉල්ලීම් කරන ලෙස ද වැඩි දුරටත් දන්වා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.